# පෙරවදන

වික්ටර් රත්නායක නාමය වූ කලී අතිශය කීර්තිමත්ය. බටහිර අංක විද්‍යාවටත් පෙරදිග ගණ ශාස්ත්‍රයටත් අනුව එම නාමය අමරණීය වන්නේය. සංසාර පුරුද්දක් මෙන් ගලා එන ඉමිහිරි සුවඳත් රසයත් එම ජනානන්දකර නාමය සමග අත්‍යන්තයෙන් බැඳී පවතී. සංගීතයේ පුරාණ අර්ථව්‍යාඛ්‍යාව අනුව ගායන වාදන නර්තන යන කලාංග තුනම මෙහි අන්තර්ගතය. වර්තමානය වන විට මේ අංග වෙන වෙනම දියුණු ශික්ෂණ ක්ෂේත්‍ර බවට පත්ව තිබේ.

මේ අප්‍රමාණ සංගීත කලාවේදියාණන් කළ කී දෑ වත ගොත, මතිමතාන්තර ගැන බොහෝ කරුණු අපි කුඩා කාලයේ පටන් කියවා ඇත්තෙමු. මා ද ඇතුළු බොහෝ දෙන හැකිතාක් එම තොරතුරු නිර්මාණ රසමංජරිය එකතු කොට සුරක්ෂිතව තබාගෙන හදාරමින් සිටිමු. තවමත් කියවා නිම කළ නොහැකි රසවාහිනී ග්‍රන්ථයක් බඳු මේ අද්විතීය සංගීත කලාවේදියාණෝ, චමත්කාරජනක වේදයිත ඉස්මතු කළ අග්‍රගණ්‍ය සංගීත ප්‍රණීතාංගයකි. සෞන්දර්ය නිකේතනයකි. විද්‍යාස්ථානයකි. ජීවිතය නමැති කෞතුකාගාරයේ සංයෝගය දනවන ශෘංගාර රසවේදයිතයේ පටන් වියෝගයේ කම්පනය දක්වා විශාල පරාසයක විහිදුණු ඔවුන්ගේ නිර්මාණ පරාසය දැවැන්තය. සුවිශාලය. ආරෝහ පරිණාහ පාංශු දේහධාරී ස්වීයත්වයෙන් පරිපූර්ණ ස්වකීය අනන්‍යතා ලක්ෂණ පළට කළ නිර්මාණ සහසින් බිහිකළ එතුමා ලැබූ විවිධ සම්මාන රාශියකි. විශ්වවිද්‍යාල ක්ෂේත්‍රය ඔහුට සාහිත්‍යසූරි උපාධිය පිරිනැමීය. ඒ සියල්ල අතර බහුජන සම්මානය ප්‍රබලය. ශුද්ධවූ ඕම්කාරය බඳු අනන්ත පවිත්‍ර භාවමංජරියක්, සුලාලිත රිද්මීය යාඥාවක්, ගාම්භීර ශ්ලෝක ධාරාවක්, ගාථා පිරිත් සජ්ඣායනයක ඉමිහිර මෙන්ම නිසංසලතාව දනවන භාවනාවක්ද අධ්‍යාත්මික ශක්තියක්ද ඔහුගේ ඇතැම් ගීයක ධ්වනිත වෙයි.

ප්‍රලය වූ කාම රාගලෝලී ශෘංගාරාවනද්ධ ප්‍රේමයේ අනුරතියේ ප්‍රකම්පනය තවත් වරෙක විශද වෙයි. එද ඕලාරිකාව නොවේ. සංයමයෙනි. දේශවාත්සල්‍යයෙන්, ජාතිකත්වයෙන් සිය සංස්කෘතියේ ශිෂ්ටාචාරයෙහි ස්වලක්ෂණ විටෙක ඔහුගේ නිර්මාණ වෙතින් නිංනාද වෙයි. අර්ථ සම්පන්න ගී පද මාලා සුනිශිත රසාලිප්ත පරිසමාප්ත තනු හා සංගීත අලංකාර රසෝජාවත් ඔහුගේ නිර්මාණ ජීවිතයේ කැඩපතක් සේ පළට වන්නේය. මේ සම්බන්ධ බොහෝ ඇගයුම් නිණැයුම් බිහිව ඇත.

ප්‍රකට ගී පද රචකයකු, වෘත්තියෙන් ඉංජිනේරුවරයකු වූ සිසිර දිසානායක විද්වතා මේ නිර්මාණ සාගරයේ කිමිදෙයි. අප බොහෝ දෙනකු උත්සුක වන්නේ සාහිත්‍ය විචාර කිරීමටය. ඒ අපේ පුහුණුව ඇබ්බැහිය පුරුද්ද කරණ කොටය. සංගීත විචාර කලාව අප රටට ආගන්තුකය. මෙහිදී සිසිර

කිසියම් ප්‍රාමාණාත්මක සාධනීය කාර්යයක නිරතවෙමින් වික්ටර් රත්නායකයන් වෙතින් නිර්මිත කලා භූමිකාව අර්ථ ව්‍යක්තිත්වයකට පත්කරන්නට මාන බලයි. අමූර්ත නාද ධ්වනි, ශ්‍රැති, ස්වර, තාල ඥාණ සම්ප්‍රයුක්ත භාව, වේග ප්‍රමාණ කිරීම විචාරය කිරීම ඉසියුම් කටයුත්තකි. ප්‍රබල අභ්‍යාසයකි. ත්‍රිස්ථානශෝභි ගායන ලීලා සහිත ගාන්ධර්වයකුගේ නිර්මාණ භූමිකාව විමංසනය කිරීම කිරෙන් දිය වෙන්කිරීමක් බඳුය. ඊට සාහිත්‍ය විචාරය මෙන්ම සංගීතමය පරිචය ද සෞන්දර්ය කලාවේ දාර්ශනික සංකල්ප චින්තාවන් පිළිබඳ දැනුමක්ද සියත් සැකැසිය හැදියාව රට දැය බස සමය හා මිනිසත් බව සම්බන්ධ තියුණු නිමල පිවිතුරු දසුනක්ද අවැසිය.

දුෂ්කර මාර්ගයක සැරිසරමින් සිසිර දිසානායක ගන්නා මහදුත්සාහය සපුරා අගය කරන්නෙමි. පැටි දිවියෙහි පටන් අසා පුරුදු ඒ මධුර කණ්ඨ ධ්වනිය පරිකල්පන ශක්තිය, ප්‍රතිභාව, ප්‍රබුද්ධ පෞරුෂය සහිත අප්‍රමාණ කලාවේදී ආචාර්ය වික්ටර් රත්නායකයන් වෙත සුළවතුන්ගේ සුභාසිරි මෙසේ පිරිනමනුයේ කෘතවේදීත්වයෙනි. ගෞරව බහුමාන පුරස්සරවය, චිරජීවනය ප්‍රාර්ථනා කරමිනි.

ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර